# නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී

## මූලික තොරතුරු ලේඛනය

### ව්‍යාපාර බැංකුකරණ වත්කම් සහ වගකීම්

- *පොදු මූලික කරුණු*
- *දීර්ඝ කාලීන ණය*
- *කෙටි කාලීන ණය*
- *බෙදාහැරීම් මූල්‍ය පහසුකම*
- *ආදායක මූල්‍ය පහසුකම*
- *චෙක්පත් කළමනාකරණ සේවය*
- ***NDB** සාමාන්‍ය ජංගම ගිණුම*

වර්ගීකරණය : පොදු

## පොදු මූලික කරුණු

**තැන්පතු රක්ෂණ ආවරණය**

NDB බැංකුව වෙත නිකුත්කර ඇති බැංකු බලපත්‍රය ශ්‍රී ලංකා මහබැංකුව විසින් (CBSL) අවලංගු කලහොත් කලින් කල ශ්‍රී ලංකා මහබැංකුව (CBSL) විසින් නිශ්චය කරනු ලබන උපරිම මුදලක් දක්වා, යෝග්‍ය තැන්පතුකරුවන් සඳහා වන්දි පූරණය කිරීමේ අරමුණින් යුතුව ශ්‍රී ලංකා මහබැංකුව (CBSL) විසින්, නිකුත් කරනු ලබන දැනට බලපවත්නා විධාන සහ නියෝග ප්‍රකාරව, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ සියලු යෝග්‍ය තැන්පත්කරුවන් රක්ෂණය කරනු ලැබේ.

**ක්‍රියාත්මක නොවන/ අක්‍රීය වූ සහ අත්හැර දමන ලද ගිණුම්**

මාස දොළහක (12) අඛණ්ඩ කාලසීමාවක් සඳහා ගනුදෙනුකරු විසින් ගනුදෙනු කටයුතු සිදුකර නොමැති, විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් ද ඇතුලු, යම් ජංගම හෝ ඉතුරුම් ගිණුමක් "ක්‍රියාත්මක නොවන ගිණුමක්" ("Inactive account") ලෙස ද මාස විසිහතරක (24) අඛණ්ඩ කාලසීමාවක් සඳහා ගනුදෙනුකරු විසින් ගනුදෙනු කටයුතු සිදුකර නොමැති, එවැනි යම් ගිණුමක් "අක්‍රීය වූ ගිණුමක්" ("Dormant account") ලෙස ද NDB බැංකුව විසින් වර්ගීකරණය කරනු ලැබේ. "එසේ ක්‍රියාත්මක නොවන" / "අක්‍රීය" ගිණුමක් වශයෙන් බැංකුව විසින් වර්ගීකරණය කරන ලද යම් ගිණුමක් නැවත ක්‍රියාත්මක කිරීම සඳහා ගිණුම්හිමියා විසින් ස්වකීය බැංකු ශාඛා කළමනාකරු හෝ සම්බන්ධතා කළමනාකරු හමුවී ලිඛිත ඉල්ලීමක් භාරදිය යුතු ය.

ගනුදෙනුකරු විසින් වසර දහයක (10) කාලසීමාවක් සඳහා කිසිදු ක්‍රියාකාරකමක් සිදුකර නොමැති බවට වාර්තා වී ඇති ගිණුම්, බැංකු පනත යටතේ අත්හැරදමන ලද දේපළ වශයෙන් සලකනු ලබන අතර එවැනි ගිණුම් ඒ අනුව කලින්කලට ශ්‍රී ලංකා මහබැංකුව විසින් නිකුත්කරනු ලබන විධාන ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) වෙත පවරනු ලැබේ.

ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පවරා ඇති එවැනි අත්හැර දමන ලද දේපළ සඳහා හිමිකම් ඉදිරිපත් කිරීමට ගිණුම්හිමියා විසින් අපේක්ෂා කරනු ලබන අවස්ථාවක දී, ඔහු/ඇය විසින් ස්වකීය බැංකු ශාඛා කළමනාකරු හෝ සම්බන්ධතා කළමනාකරු හමුවී බැංකුවේ ප්‍රමිතිගත ආකෘතියෙන් ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතු ය.

**වර්ගීකරණය :** පොදු

**පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ කාර්ය පටිපාටිය**

බැංකුවේ ආසන්නතම ශාඛාව වෙත හෝ බැංකුවේ ඇමතුම් මධ්‍යස්ථානය වෙත හෝ ප්‍රධාන කාර්යාලය වෙත, බැංකුවේ නිල වෙබ් අඩවිය හරහා හෝ බැංකුවේ යම් නිල ප්‍රකාශයක් හෝ නිවේදනයක් හරහා දැනුම් දී ඇති කාර්ය පටිපාටියට අනුව, බැංකුව වෙත වාචිකව හෝ ලිඛිතව ඕනෑම පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම සඳහා ගිණුම්හිමියාට අයිතියක් ඇත. එවැනි යම් පැමිණිල්ලක් විසඳා නොමැති අවස්ථාවක දී, ගිණුම් හිමියා විසින් මූල්‍ය ඔම්බුඩ්ස්මන්වරයා හරහා එම ගැටලුව සඳහා පිළිසරණක් ඉල්ලා සිටිය හැකි ය. (මෙම ලේඛනයේ අවසාන පිටුවේ සඳහන් විස්තරවලට අනුව)

**පුද්ගලික තොරතුරු ආරක්ෂා කිරීම**

ගනුදෙනුකරුගේ මූල්‍ය වත්කම් ආරක්ෂා කිරීමේදී මෙම තොරතුරු ඉතාමත් තීරණාත්මක වන බැවින්, කිසිදු අවස්ථාවක ගනුදෙනුකරු විසින් මුරපද (Passwords), රහස් අංක (PIN අංක) හා එක්වරක් පමණක් භාවිතාකරන මුරපද (OTP) යනාදි සංවේදී තොරතුරු වෙනත් කෙනෙකු සමග හුවමාරු කිරීමෙන් වැළකී සිටිය යුතුවේ. වෙනත් ඕනෑම පාර්ශවයකට මෙම සංවේදී තොරතුරු වෙත ප්‍රවේශ විය හැකි පරිදි රහස් අංක (PIN අංක), මුරපද, OTP පිළිබඳ කිසිදු ආකාරයකින් කිසිදු ලිඛිත වාර්තාවක් ගනුදෙනුකරු විසින් පවත්වාගෙන නොයා යුතුවේ. PIN අංක, මුරපද සහ OTP වෙනත් තැනැත්තකුට පවරනු නොලැබිය යුතු මෙන්ම ඒවා අදාල ගනුදෙනුකරුගේ භාවිතයට පමණක් සීමා විය යුතු ය. එවැනි සංවේදී තොරතුරු දැඩි රහස්‍ය භාවයෙන් පවත්වාගෙන යෑම ගනුදෙනුකරුගේ සම්පූර්ණ වගකීම වේ.

**ගිණුම වෙත ප්‍රවේශවීම පාලනය කිරීම**

අනවසර ගනුදෙනු සිදුවන අවස්ථාවක දී ගනුදෙනුකරුවන් ඒ සම්බන්ධයෙන් වගකීමට යටත්වන බැවින් සහ ඒ සම්බන්ධයෙන් නීතිය බලාත්මක කිරීමේ නියෝජිත ආයතන සමග සහයෝගීව ක්‍රියාකිරීමට සිදුවන බැවින්, ගනුදෙනුකරුවන් විසින් ස්වකීය ගිණුම් ක්‍රියාත්මක කිරීම සඳහා තුන්වන පාර්ශවයන් වෙත අවසර ලබා නොදිය යුතු ය.

**ගිණුම් වසා දැමීම සහ ඒ හා සම්බන්ධ ගාස්තු**

බැංකුව වෙත පූර්ව ලිඛිත නිවේදනයක් ලබාදීමෙන් පසුව ස්වකීය ඕනෑම ගිණුමක් වසා දැමීමේ අයිතිය ගනුදෙනුකරුවන් සතුවේ. එසේ වුව ද, ගිණුම් වසාදැමීම හා ආශ්‍රිතව අදාල විය හැකි බැංකු ගාස්තු පැවතිය හැකි බවට සැලකිය යුතු වේ.

**බදු සහ ගාස්තු**

රඳවුම් බදු (WHT), ආදායම් බදු, මූල්‍ය සේවා, VAT බදු යනාදිය ඇතුලු සියලු බලපවත්වන්නා බදු හෝ ගාස්තු, බලපවත්නා බදු සහ වෙනත් අදාල නියෝගවලට අනුකූලව අයකරනු ලැබේ. පනවා ඇති හෝ වෙනත් යම් බලධරයකු (බලධරයන්) විසින් පනවනු ලැබිය හැකි FATCA විධිවිධාන හෝ වෙනත් යම් නියෝගයක්/ නියෝගවල සඳහන් විධිවිධාන මගින් නියමකර ඇති IRD වෙත හෝ වෙනත් යම් නියාමන අධිකාරියක්/ අධිකාරීන් වෙත ගෙවිය යුතු අදාල බදු සහ/හෝ ගාස්තු ප්‍රේෂණය කිරීම සඳහා බැංකුව වෙත බලය පවරා ඇත.

**වර්ගීකරණය :** පොදු

## මූලික තොරතුරු ලේඛනය - දීර්ඝ කාලීන ණය

| නිෂ්පාදනය/ සේවය | විශේෂ ලක්ෂණ | ගාස්තු/ අයකිරීම් කොමිස් මුදල්, පොළිය | නිෂ්පාදනය/ සේවය ලබා ගැනීම සඳහා අනුගමනය කරනු ලැබිය යුතු කාර්ය පටිපාටිය | ප්‍රධාන නියම හා කොන්දේසි |
| --- | --- | --- | --- | --- |
| **දීර්ඝ කාලීන ණය** | • පවත්නා ආකාරයට සහනදායී අනාවරණ සීමා සහ සංචිත අරමුදල් යටතේ වන ණය මුදල්<br>• ණය ගෙවීමේ කාලසීමාව - ව්‍යාපෘති කාලසීමාව මත පදනම්ව වසර 2 ක් සහ ඊට වැඩි<br>• තරඟකාරී පොළී අනුපාතික<br>• EMI මත හෝ හීනවන ශේෂ පදනම මත වාරික ගණනය කිරීම<br>• ව්‍යාපෘතියේ ස්වභාවය මත පදනම්ව සහන කාලසීමාවක් පැවතීම<br>• ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රවාහය මත පදනම්වන කාලසීමාව | • ගාස්තු/ අයකිරීම් - NDB වෙබ් අඩවියෙහි පළකරනු ලබන ගාස්තුවලට අනුකූල වේ: https://www.ndbbank.com/downloads<br>• ණය මුදලේ ස්වභාවය මත පදනම්ව ස්ථාවර හෝ විචල්‍ය පොළී අනුපාතික තෝරාගැනීමේ විකල්පය | • ගණුදෙනුකරු සමග මූලික සාකච්ඡා පැවැත්වීම<br>• යථාපරිදි සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය<br>• ව්‍යාපාරය පිළිබඳ මූල්‍ය ප්‍රකාශය ඉදිරිපත් කිරීම<br>• ඉදිරිපත් කරනු ලබන ඇපකර විස්තර ඇතුලු අරමුදල් සැපයීම් විස්තර සහ තහවුරු කිරීමේ ලේඛන ඉදිරිපත් කිරීම<br>• අදාල අනුමත අධිකාරියෙන් අනුමතය ලබාගැනීමෙන් පසුව පිළිගැනීම සඳහා පහසුකම් අර්පන ලිපිය ඉදිරිපත් කිරීම<br>• නියම හා කොන්දේසි ප්‍රකාරව ඇපකර ලේඛන/ නෛතික ලේඛන ලියා අත්සන් කිරීමෙන් පසුව ණය මුදල නිදහස් කිරීම<br>• අදාල අධිකාරීන්ගෙන් අනුමතය ලබාගැනීමෙන් පසුව ප්‍රතිමූල්‍ය අනුපාතික බලාත්මක වීම | • මාසික පදනම මත ගෙවීම් සිදුකිරීම<br>• විශේෂ කොන්දේසිවලට, පූර්ව බලාත්මක සහ පූර්ව නිදහස්කිරීම් කොන්දේසිවලට අනුකූලව ක්‍රියාකිරීම<br>• බැංකුව විසින් නිශ්චිතව දක්වනු ලබන පොදු කොන්දේසි<br>• අවශ්‍ය සියලු ලේඛන සම්පූර්ණ කිරීමට යටත්ව සහ බැංකුවේ ණය ඇගයීම් නිර්නායකයට අනුකූලව බැංකුවේ පරම අභිමතය පරිදි පහසුකම් ලබාගත හැකිවීම |

**වර්ගීකරණය :** පොදු

# මූලික තොරතුරු ලේඛනය - කෙටි කාලීන ණය

| නිෂ්පාදනය/ සේවය | විශේෂ ලක්ෂණ | ගාස්තු/ අයකිරීම් කොමිස් මුදල්, පොළිය | නිෂ්පාදනය/ සේවය ලබා ගැනීම සඳහා අනුගමනය කරනු ලැබිය යුතු කාර්ය පටිපාටිය | ප්‍රධාන නියම හා කොන්දේසි |
|---|---|---|---|---|
| **කෙටි කාලීන ණය** | • ව්‍යාපාරයේ කාරක ප්‍රාග්ධන චක්‍රය මත ගෙවීම් කාලසීමාව රඳා පැවතීම<br>• සහනදායී පොළී අනුපාතික | • ගාස්තු/ අයකිරීම් - NDB වෙබ් අඩවියෙහි පළකරනු ලබන ගාස්තුවලට අනුකූල වේ: https://www.ndbbank.com/downloads<br>• පොළී අනුපාතිකය - ස්ථාවර හෝ විචල්‍ය (වෙළඳපල අනුපාතික මත රඳාපවතියි) | • ගණුදෙනුකරු සමග මූලික සාකච්ඡා පැවැත්වීම<br>• යථාපරිදි සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය<br>• ව්‍යාපාරය පිළිබඳ මූල්‍ය ප්‍රකාශය ඉදිරිපත් කිරීම<br>• ඉදිරිපත් කරනු ලබන ඇපකර විස්තර ඇතුලු අරමුදල් සැපයීම් විස්තර සහ තහවුරු කිරීමේ ලේඛන ඉදිරිපත් කිරීම<br>• අදාල අනුමත අධිකාරියෙන් අනුමතය ලබාගැනීමෙන් පසුව පිළිගැනීම සඳහා පහසුකම් අර්පන ලිපිය ඉදිරිපත් කිරීම<br>• නියම හා කොන්දේසි ප්‍රකාරව ඇපකර ලේඛන/ නෛතික ලේඛන ලියා අත්සන් කිරීමෙන් පසුව ණය මුදල නිදහස් කිරීම | • අවශ්‍ය සියලු ලේඛන සම්පූර්ණ කිරීමට යටත්ව සහ බැංකුවේ ණය ඇගයීම් නිර්නායකයට අනුකූලව බැංකුවේ පරම අභිමතය පරිදි පහසුකම් ලබාගත හැකිවීම |

**වර්ගීකරණය :** පොදු

## මූලික තොරතුරු ලේඛනය - බෙදාහැරීම් මූල්‍ය පහසුකම

| නිෂ්පාදනය/ සේවය | විශේෂ ලක්ෂණ | ගාස්තු/ අයකිරීම් කොමිස් මුදල්, පොළිය | නිෂ්පාදනය/ සේවය ලබා ගැනීම සඳහා අනුගමනය කරනු ලැබිය යුතු කාර්ය පටිපාටිය | ප්‍රධාන නියම හා කොන්දේසි |
|---|---|---|---|---|
| **බෙදාහැරීමේ මූල්‍ය පහසුකම** | • NDB බැංකුවේ ලියාපදිංචි මහා පරිමාණ ආයතනික සේවාදායක බෙදාහැරීම් කටයුතුවල යෙදී සිටින සේවාදායකයන් වෙනුවෙන් කෙටිකාලීන කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම | • වෙළඳපල අනුපාතිකවලට අනුකූලව වීම<br>• විචල්‍ය සහ ස්ථාවර අනුපාතික යන ප්‍රභේද දෙකම පිරිනැමිය හැකිවීම | • සේවාදායක සමග සාකච්ඡා කිරීම<br>• ලිපි ලේඛන සම්පූර්ණ කිරීම<br>• බැංකුව විසින් වැඩකටයුතු ඇගයීම<br>• පහසුකම පිරිනැමීම සහ භාරගැනීම<br>• පහසුකම ආරම්භ කිරීම<br>• ගැනුම්කරුගෙන් ලැබෙන ගෙවීමෙන් කල්පිරීමේ GRN ගෙවා නිරාකරණය කිරීම | • අර්පණ ලිපියේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට |

## මූලික තොරතුරු ලේඛනය - ආදායක මූල්‍ය පහසුකම

| නිෂ්පාදනය/ සේවය | විශේෂ ලක්ෂණ | ගාස්තු/ අයකිරීම් කොමිස් මුදල්, පොළිය | නිෂ්පාදනය/ සේවය ලබා ගැනීම සඳහා අනුගමනය කරනු ලැබිය යුතු කාර්ය පටිපාටිය | ප්‍රධාන නියම හා කොන්දේසි |
|---|---|---|---|---|
| **ආදායක මූල්‍ය පහසුකම** | • බැංකුව පිළිගත් වෙළඳ ආදායක සඳහා මූල්‍යකරණය කිරීම මගින් ස්වකීය කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා දැනට සිටින සහ අපේක්ෂිත NDB සේවාදායකයන් සඳහා හැකියාව ලබාදීම | • වෙළඳපල අනුපාතිකවලට අනුකූලව වීම<br>• විචල්‍ය අනුපාතික පිරිනැමිය හැකිවීම | • සේවාදායක සමග සාකච්ඡා කිරීම<br>• ලිපි ලේඛන සම්පූර්ණ කිරීම<br>• බැංකුව විසින් වැඩකටයුතු ඇගයීම<br>• පහසුකම පිරිනැමීම සහ භාරගැනීම<br>• පහසුකම ආරම්භ කිරීම<br>• ඇගයීම් දිනයේ දී චෙක්පත් නිශ්කාශනය කිරීම මගින් කල්පිරීමේ ණයමුදල් අයකරගැනීම | • අර්පණ ලිපියේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට |

**වර්ගීකරණය :** පොදු

## මූලික තොරතුරු ලේඛනය - චෙක්පත් කළමනාකරණ සේවය

| නිෂ්පාදනය/ සේවය | විශේෂ ලක්ෂණ | ගාස්තු/ අයකිරීම් කොමිස් මුදල්, පොළිය | නිෂ්පාදනය/ සේවය ලබා ගැනීම සඳහා අනුගමනය කරනු ලැබිය යුතු කාර්ය පටිපාටිය | ප්‍රධාන නියම හා කොන්දේසි |
|---|---|---|---|---|
| **චෙක්පත් කළමනාකරණ සේවය** | • විශාල චෙක්පත් ප්‍රමාණයක් කළමනාකරණය කිරීම | ප්‍රමාණය මත පදනම්වීම - චෙක් පත්‍රිකාවක් සඳහා රු. 25/- ක ස්ථාවර ගාස්තුවක් හෝ චෙක්පත් වටිනාකමින් 0.1 % ක් අදාල වේ | • සේවාදායක සමග සාකච්ඡා කිරීම<br>• ලිපි ලේඛන සම්පූර්ණ කිරීම<br>• පහසුකම පිරිනැමීම සහ භාරගැනීම<br>• චෙක්පත් ගබඩා කිරීම | • අර්පණ ලිපියේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට |

## මූලික තොරතුරු ලේඛනය - NDB ජංගම ගිණුම

| නිෂ්පාදනය/ සේවය | දිරිගැන්වීම් සහ ප්‍රවර්ධන ඇතුලු මූල්‍යමය සහ වෙනත් ප්‍රතිලාභ | ගාස්තු/ අයකිරීම් කොමිස් මුදල්, පොළිය | නිෂ්පාදනය/ සේවය ලබා ගැනීම සඳහා අනුගමනය කරනු ලැබිය යුතු කාර්ය පටිපාටිය | ප්‍රධාන නියම හා කොන්දේසි |
|---|---|---|---|---|
| **NDB සාමාන්‍ය ජංගම ගිණුම** | • NEOS ජංගම බැංකු සේවය සහ මාර්ගගත බැංකු සේවා පහසුකම මෙන්ම විද්‍යුත් ප්‍රකාශ පහසුකම සඳහා සුදුසුකම් ලැබීම<br>• නිත්‍ය නියෝග පහසුකම සඳහා සුදුසුකම් ලැබීම<br>• ස්වීප් ඉන්/ ස්වීප් අවුට් පහසුකම් සඳහා සුදුසුකම් ලැබීම (තම ගිණුමේ පවතින මුදල් එදිනම වෙනත් ගිණුමකට මාරු කිරීමේ පහසුකම) | සවිස්තරාත්මක සහ අලුත්ම ගාස්තු මෙන්ම අවම ශේෂ අවශ්‍යතා දැනගැනීම සඳහා කරුණාකර NDB වෙබ් අඩවියේ පවතින ගාස්තු අත්පොත කියවා බලන්න. | • ශාඛා කළමනාකරු විසින් සිදුකරන පුද්ගලික සම්මුඛ පරීක්ෂණය<br>• මැන්ඩේට් පත්‍රය සම්පූර්ණ කිරීම<br>• හඳුන්වාදීම (වර්තමාන ජංගම ගිණුම් හිමියකු විසින් සිදුකරන) | • වයස අවුරුදු 18 ට වැඩි ශ්‍රී ලාංකික නේවාසිකයන්<br>• මූලික තැන්පතුව සහ අවම සාමාන්‍ය ශේෂ මුදල දැනගැනීම සඳහා කරුණාකර NDB බැංකු වෙබ් |

**වර්ගීකරණය :** පොදු

| | | | | |
|---|---|---|---|---|
| | • දිවයින පුරා පවතින ශාඛා ජාලය හරහා පහසුවෙන් මුදල් තැන්පත්කිරීම/ මුදල් ආපසු ගැනීම/ ගිණුම් අතර මුදල් හුවමාරු කිරීම සහ තෝරාගත් ශාඛාවලදී දීර්ඝකරන ලද කාලසීමාවල දී බැංකු පහසුකම් ලබා ගැනීමේ පහසුකම<br>• වීසා (Visa) සේවා පහසුකම් සහිත ඩෙබිට් කාඩ්පත හරහා ලෝකයේ ඕනෑම තැනක සිට පැය 24 පුරා ඔබගේ ගිණුම වෙත ප්‍රවේශ වීමේ හැකියාව<br>• සාමාන්‍ය ශේෂයක් පවත්වාගෙන යෑම මගින් ව්‍යාපාර බැංකුකරණ කාණ්ඩගත ප්‍රතිලාභ භුක්ති විදීම් සඳහා සුදුසුකම් ලැබීම<br>වැඩි විස්තර සඳහා https://bit.ly/4cO5Ywb සබැඳිය වෙත පිවිසෙන්න | https://www.ndbbank.com/downloads | • KYC අවශ්‍යතාවය (ඔබගේ ගනුදෙනුකරු හඳුනාගැනීම)<br>• වලංගු ජාතික හැඳුනුම්පතෙහි (NIC) පිටපතක් සහ ජාතික හැඳුනුම්පත නොමැති නම්, ජා.හැ.පත් අංකය සඳහන්වන රියදුරු බලපත්‍රය/ විදේශ ගමන් බලපත්‍රය.<br>• ලිපිනය සනාථ කිරීමක් (අවශ්‍ය වේනම්) | අඩවියේ පවතින ගාස්තු අත්පොත කියවා බලන්න<br>• KFD සහ නිෂ්පාදන සේවය පිළිබඳ අදාල නියම හා කොන්දේසි අතර විෂමතාවක් පවතීනම්, KFD බලාත්මක විය යුතු ය |

**ඔබගේ අදහස් හා යෝජනා අප සමග හුවමාරු කරගන්න**

සෑම අවස්ථාවකදීම විශිෂ්ඨ, උපරිම සේවාවක් ඔබ වෙත සැපයීම සඳහා අප ඇපකැපවී සිටින්නෙමු.
අප විසින් ඔබගේ අපේක්ෂාවන් කොතරම් හොඳින් ඉටුකර ඇද්ද යන්න පිළිබඳව දැනගැනීම සඳහා සහ අවශ්‍ය අවස්ථාවලදී දියුණු කරගතයුතු කරුණු පිළිබඳව දැනුවත්වීම සඳහා ඔබගේ අදහස් හා යෝජනා අප හට උපකාරීවනු ඇත.

**ඔබගේ අදහස් යොමු කළ යුතු ආකාරය:**

ඔබට ඔබගේ ශාඛා කළමනාකරු (ශාඛා සම්බන්ධතා විස්තර) හෝ ඔබගේ සම්බන්ධතා කළමනාකරු හා සම්බන්ධ විය හැකි ය.

අංක. +94 11 2448888/ +94(0) 11 7448888 දරන පැය 24 පුරා ක්‍රියාත්මකවන ඇමතුම් මධ්‍යස්ථාන අංකය අමතන්න.

අප වෙත විද්‍යුත් තැපෑලෙන් යොමු කරන්න:- contact@ndbbank.com

ලිඛිතව ඉදිරිපත් කරන්න:- ගනුදෙනුකාර ප්‍රවීනතා නිලධාරී, නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී අංක. 92, බර්නාඩ් සොයිසා මාවත, කොළඹ 05

**වර්ගීකරණය :** පොදු

**අප විසින් ප්‍රතිචාර දක්වන ආකාරය;**

පැමිණිල්ල ලැබීමෙන් පසුව, අප විසින් එය බැංකුවේ පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියාකිරීමේ පද්ධතියෙහි වාර්තාකර එම ගැටළුව වහාම විසදීම සඳහා උත්සාහ කරන්නෙමු. අපට එසේ ක්‍රියාකිරීමට අපොහොසත් වන අවස්ථාවක දී, අප විසින් ඔබ වෙත වැඩකරන දින තුනක් ඇතුලත විසඳුමක් ලබා දෙන්නෙමු. පැමිණිල්ලේ ස්වභාවය අනුව මෙම කාලසීමාව තුලදී මෙම ගැටලුව විසදීමට අපට නොහැකි වුවහොත්, අප විසින් ඔබවෙත ප්‍රතිචාර දක්වනු ලබන ඇස්තමේන්තුගත කාලය පිළිබඳව ඔබව දැනුවත් කරන්නෙමු.

ඔබගේ ගැටලුව සම්බන්ධයෙන් වූ අපගේ ප්‍රතිචාරය සමග ඔබ කිසිසේත් සෑහීමට පත් නොවන්නේ නම්, ඔබට ශ්‍රී ලංකාවේ මූල්‍ය ඔම්බුඩ්ස්මන් කාර්යාලය සමග සම්බන්ධවිය හැකි වේ.

**ආනන්ද කුමාරදාස මහතා**
මූල්‍ය ඔම්බුඩ්ස්මන්
මූල්‍ය ඔම්බුඩ්ස්මන් කාර්යාලය
143A, වජිර පාර,
කොළඹ 05
**දුරකතන අංකය:** +94 11 259 5624
දුරකතන ෆැක්ස් අංකය: +94 11 259 5625
ඊ මේල්: fosril@sltnet.lk
වෙබ් අඩවිය: www.financialombudsman.lk

**ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව. (FCRD)**
තැපැල් ලිපිනය : මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව
අංක. 30, ජනාධිපති මාවත, කොළඹ 01
විමසීම් සඳහා වන ක්ෂණික ඇමතුම් අංකය : 1935
දුරකතන අංකය : +9411247766
ෆැක්ස් අංකය: +94112477444
ඊ මේල් : fcrd@cbsl.lk

**වර්ගීකරණය :** පොදු